

# ශ්‍රී ලංකාවේ ආදිවාසීන් ගේ සමාජය හා ජීවන රටාව

ලෝකයේ යම් රටක මුල් පදිංචි කරුවන් හෙවත් ජානපදිකයන් ආදිවාසීන් හෙවත් 'වැද්දන්' ලෙසින් හඳුනා ගත හැකි ය.

'ජාත්‍යන්තර කම්කරු සංවිධානය' විසින් ආදිවාසීන් යනු කවුරුන් ද යන්න මෙසේ අර්ථ දක්වා ඇති බව දැන ගත හැකි ය.'

රටක ජාතික ප්‍රජාවෙන් සමාජීය, සංස්කෘතික හා ආර්ථික තත්ත්වයන් ගෙන් වෙන් වූ ලක්ෂණ හිමි ගෝත්‍රික ජන කොටස් මෙන් ම පාරම්පරික මුල් පදිංචිකරුවන් ගෙන් පැවතෙන සිරිත් විරිත් සම්ප්‍රදායන් හා අනන්‍යතාවන් රැකෙන ලෙස ජීවත්වන එම පරම්පරාවට අයත් ජන කොටස් ආදිවාසින් ලෙස සැලකේ.

මේ අයුරින් ආදිවාසින් පිළිබඳ සලකා බැලීමේ දී ඔවුන් ඔවුන්ට ම ආවේණික වූ සම්ප්‍රදායයක් රැක ගෙන ඔවුන් ගේ පාරම්පරික උරුමය ඉදිරියට රැගෙන යන්නට වෙර දැරි මිනිසුන් පිරිසක් බව මනාව පැහැදිලි වනු ඇත. වැද්දන් දිවිපෙවෙත ගත කරනුයේ වනාන්තරයේ නොහොත් අප ගේ වනචාරී යුගයේ ය. ඈත අතීතයේ සිට පරිසරය ආරක්ෂා කරමින්, පරිසරයට ආදරය කරමින්, පරිසරය හා මනා සබැඳියාවකින් ජීවත් වූ මොවුන්, ස්වාභාවික පරිසරය රැක ගන්නට පැමිණි මුර රැකවලුන් ලෙසින් ද අපට ඇතැම් විට සිතේ.


මිනිසා ගේ අවශ්‍යතා සංකීර්ණවීමත් සමඟ ඒවාට අනුගත වූ මිනිසා ඒවා ඉටුකර ගැනීමට යාමේදී වර්තමානයේ කරනු ලබන්නේ සොබාදහම තමාට අවශ්‍ය පරිදි වෙනස් කරමින් මහපොළොව, මුහුද, ගුවන් ගැබ පමණක් නොව ග්‍රහලෝක පවා තරණය කිරීමයි. වර්තමාන සමාජ පරපුරට ආදී මුතුන් මිත්තන් ගේ සෙවනැලිවල ඡායාවක් වත් දකින්නට හැකිවේද යන්න සැක සහිත ය.

වැදි ජන සමාජය එකම කොට්ඨාස-යක් වුව ද ඔවුන් ගේ උපකුලක කිහිපයක් දකින්නට ලැබේ. උනාපාන වර්ගය, කුල වර්ගය, තබුඩන් වර්ගය, මොරාන වර්ගය ඉන් කිහිපයකි. වැදි සමාජය දෙස බැලීමේ දී ඔවුන් මුල්කාලීන ව ගල්ලෙන් තුළ වාසය කර ඇති අතර ස්ථිර නවාතැන් නොවී ය. විදේශීය සම්භවයක් ඇති ලක් දෙරණෙහි ජන්ම ලාභය ගත් ස්පිට්ල් දොස්තර මහතා වැද්දන් පිළිබඳ පර්යේෂණ කළ අයෙකි. ඔහුට අනුව වැද්දන් ගල්ලෙන්වලින් තවත් ගල්ලෙන්වලට මාරුවෙමින් ජීවත් වී ඇත. මෙය ඔවුන් ගේ පැරණි සමාජ සංවිධානයේ ලක්ෂණයක් වේ. නමුත් වර්තමාන වැදි සමාජය පැරණි වැදි සමාජයට බෙහෙවින් වෙනස් ව සංකීර්ණ තත්ත්වයට පත් වී ඇත. සමාජ සංවර්ධන ක්‍රමවල ව්‍යාප්තිය ද ඔවුන්ගේ ජන ජීවිතය වෙනස්වීමට බලපා ඇති බව සඳහන් කළ හැකි ය. එකල ගල්ලෙන්වල වාසය කළ වැද්දන් විසින් දුනු ආදිය භාවිත කර එයින් සතුන් දඩයම් කර පුළුස්සා කමින් සරල දිවිපෙවෙතක් ගත කරන ලදී.

නමුත් වත්මන් සමාජයේ වැද්දාට එතරම් සරල ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය වී නොමැත. අද ඔවුන් රෙදිපිළි අඳිති. වෙළෙඳපොළට ගොස් වෙළඳාම් කරති. මේ අයුරින් වැදි සමාජය වර්තමානයේ වෙනස්කම්වලට භාජනය වී ඇති බව දැකිය හැකි ය.

වැද්දන්ගේ ඇදහිලි හා විශ්වාසයන්ට හිමිවනුයේ ද ප්‍රමුඛස්ථානයකි. ඔවුන් මූලික වශයෙන් 'නෑ යකුන් පිදීම' කිරිකොරහ නැවීම ආදී යාග කිරීම සිදු කරති. එසේ ම යකුන් ඇදහීම ද මොවුන් ගේ ප්‍රධාන චාරිත්‍රයකි. වැදි මිනිසකු මළ පසු මිනිය කොළ අතුවලින් වසා දමා වලක් හාරා මළ මිනිය වලේ දමා පස් දමා වැසීම සිරිතයි. පසු ව මිය ගිය ඇත්තා සිහිකරමින් නෑ යකුන් පිදීම නම් චාරිත්‍රය සිදු කරනු ලැබේ.

වැද්දන් පිළිබඳ කතා කිරීමේ දී අවධානය යොමු විය යුතු විශේෂ කරුණක් වන්නේ ඔවුන් ගේ ජීවන රටාවයි. වනගත වැද්දන් එකල ආහාර සපයා ගත්තේ සොබා දහමෙනි. සතුන් දඩයම් කිරීම, අලවර්ග, ගෙඩි වර්ග සොයා වනගත වීම ඔවුන් ගේ ජීවන රටාවයි. කල්යත් ම මෙම ජීවන රටාව වෙනස් විය. සමාජ දියුණුවත් සමඟම හේන්



# සූප්පා දේවියට රජ සැප සිංහයාට මරණය අපට?

සූප්පා දේවිය ගේ දෛවය විසඳන්නේ කැලයේ රජා වූ සිංහයා හමුවීමෙනි. කුමරිය ගැලක සැඟවී ඈතට පිටමං වුයේ තැති ගැන්මෙනි. සිංහයා ගැල්කරුවන්ට පහරදීමේ අටියෙන් ගැල්පෙළ වෙත ළඟා වන විට අපට සිදු වූයේ ශාස්ත්‍රකරු පළ කළ අනාවැකියයි. ඒ සමඟම ඇගේ බිය පහව ගොස් සිංහයා සමඟ තම ජීවිතාන්තය තෙක් ගත කිරීමේ අටියෙන් සිංහයා ස්පර්ශ කරයි.

සිංහයා සිතන්නේ රූමත් මේ කුමරිය මා අසළට පැමිණෙන්නේ බියක් නැතිව ද යන්නයි. නුඹ මා වෙතින් පළා නො යන්නේ ඇයි? නුඹ මට බිය නැතිදැයි විමසූ විට කුමරිය ගෙන් සිංහයාට ලැබෙන්නේ අපේක්ෂා කළාට වඩා හාත්පසින් වෙනස් පිළිතුරකි. කුමරිය පවසන්නේ 'මට ඔබට බියවීමට කිසිදු බියක් නැහැ. මා ඔබට බියෙන් දුවනවා නම් එය නිවට ක්‍රියාවකි. මන්ද ඔබ කැලේ රජතුමා ය. කැලේ භයානකම සතා ඔබයි. එහෙත් ඔබෙන් මට හිරිහැරයක් නොමැති නම් වෙනත් කිසිදු උවදුරක් මේ මහා වනයේ මට නැහැ.' යන්නයි.

එක් ව විසීමෙන් ඔවුහු පුතකු හා දුවක ලබති. පුතු සිංහබාහු වන අතර දියණිය සිංහ සීවලී ය. සිංහයා තම බිරිඳට හා දරුවන්ට ගල්ලෙනක් තනන්නේ මිනිස් කටහඬවල් ඇසී ඔවුන් පිටමං වෙතියි බියෙනි. එහෙත් සිංහබාහු තරුණ වියට එළඹෙත්ම සිංහයා ගේ මේ ක්‍රියාව නො ඉවසයි. සිංහයා ගේ මේ ක්‍රියාව දාරක ප්‍රේමය නිසා උපන් එකක් යැයි සිංහබාහු නො දනී. සිංහයා ගොරවා 'මා මේ ක්‍රියාව කළේ භයානක නපුරු උවදුරුවලින් ඔබලා ආරක්ෂා කර ගැනීම පිණිස යැයි කීව ද පුතාට මව ගේ හා පියා ගේ ශරීර හැඩරුවෙහි ඇති වෙනස කතාබහේ වෙනස ආදිය හොඳින් අවබෝධ වෙයි. ඉන් නො නැවතුණු ඔහු මව ගෙන් සත්‍ය විස්තර දැන ගනී. පසුව ලෙන් දොර විවර කර ගෙන ගංගා, ගණ කැලෑ තරණය කරමින් රජවාසල බලා ගමන් ගනී. සිංහයා සිංහනාද කරමින් රට වැසියන් ගේ ගම් දෙවනත් කරමින් ගම්බිම් පීරමින් තම අඹු දරුවන් සොයමින් සැරිසරයි.

ගොවිතැන්වලින් ද මිදී නව රැකියාවන් සඳහා යොමු වී ඇති බව අපට අද දැකගත හැකි ය. නූතන වැදි දරුවෝ වේගයෙන් මහා සමාජයට අනුගත වෙමින් සිටිති. මෙය ද වත්මන් වැදි සමාජයේ දක්නට ලැබෙන ලක්ෂණයකි.

ඉහත සඳහන් කළ දෑ ආදිවාසීන් ගේ ජීවිත පිළිබඳ අල්පමාත්‍රයකි. තව බොහෝ දෑ ඔවුන් ගේ සමාජය මඟින් පිළිබිඹු කරනු ඇත. කෙසේ වුව ද ආදිවාසීන් වූ කලී අපේ රටේ ඓතිහාසික උරුමයකි. එසේ ඔවුන් ගේ සංස්කෘතිය රැකගෙන ඉදිරි පරපුරට දායාද කිරීම මෙන් ම අප ගේ ජාතික ශිෂ්ටාචාරය රැකගැනීම ද අප ගේ පරම යුතුකම වන්නේ ය. ■

**රසිකා පුෂ්පකුමාරි**